## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පුරප්පාඩු ප්‍රාදේශීය ලේකම් තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ ප්‍රාදේශීය ලේකම් තනතුරු පහත සඳහන් පරිදි පුරප්පාඩුව හා පුරප්පාඩු වීමට නියමිතව පවතී. එම ප්‍රාදේශීය ලේකම් තනතුරු සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I හා II ශ්‍රේණි වල නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවා සුදුසු නිලධාරින් එම තනතුරුවලට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

02. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/21/5/1/2024 හා 2024.08.12 දිනැති ලිපියෙන් ලබාදුන් අනුමැතිය අනුව 2016 ට පෙර බඳවා ගත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I හා II ශ්‍රේණි වල නිලධාරින් පහත සඳහන් පුරප්පාඩු ප්‍රාදේශීය ලේකම් තනතුරු සඳහා පත්වීමට අපේක්ෂා කරන්නේ නම්, එම අපේක්ෂිත ප්‍රාදේශීය ලේකම් තනතුර හෝ තනතුරු මනාප ප්‍රමුඛතාවය සඳහන් කරමින්, වත්මන් තනතුරෙන් නිදහස් කිරීමට එකඟතාවය සහිතව දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඇමුණුම 01 හි සඳහන් ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පතක් 2025.08.15 දිනට පෙර පහත ලිපිනයට යොමු කළ යුතුවේ.

| අංකය | දිස්ත්‍රික්කය | පුරප්පාඩුව පවතින හා පුරප්පාඩු වීමට නියමිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
|---|---|---|
| 1 | අම්පාර | උහන |
| 2 | ගම්පහ | ජා ඇල |
| 3 | මොණරාගල | තණමල්විල |
| 4 | නුවරඑළිය | නෝර්වුඩ් |
| 5 | පුත්තලම | කල්පිටිය |
| 6 | | මහකුඹුක්කඩවල |
| 7 | | පුත්තලම |
| 8 | ත්‍රිකුණාමලය | පදවිශ්‍රීපුර |
| 9 | | සේරුවිල |
| 10 | | තඹලගමුව |

ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා
සහ පළාත් පාලන අමාත්‍යාංශය,
"නිල මැදුර"
ඇල්විටිගල මාවත,
කොළඹ 05

2025.07.30